ප්‍රාග් මානවයාගේ ජීවන රටාවේ පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණය සඳහා සත්ත්ව අස්ථි විශ්ලේෂණයේ වැදගත්කම.

සුදේවි රණසිංහ[1] සහ ගාමිණී අධිකාරි[2]

[1]පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව; [2]පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

sudeviranasinghe@ymail.com

පුරාවිද්‍යාත්මක කැණීමකදී හමුවන සත්ත්ව අවශේෂ ඒවා අයත් සතුන් පරිභෝජනය කළ මිනිසාගේ යැපීම් උපාය මාර්ග තේරුම් ගැනීමට අදාළ වන වැදගත් නිර්ණායකයකි. එවැනි අර්ථ නිරූපණයකට මිනිස් සමාජවල කණ්ඩායම් සනත්වය, සමාජ සංවිධානය වූ ආකාරය ජනාවාස ස්ථානගත වූ ආකාරය, වාසස්ථානවල ස්වභාවය, ආයුධ නිෂ්පාදනය සහ එහි තාක්ෂණය, ප්‍රවාහන කටයුතු සහ පැරණි පාරිසරික තත්ත්ව හඳුනාගැනීම යනාදී කරුණු ගණනාවක් ඇතුළත් කළ හැකිය.

මිනිසා සහ සතුන් අතර පවතින සබඳතාවයේ ඉතිහාසය ඉතා ඈත කාලයකට අයත්ය. මිනිසා, මිනිසා කෙරෙහි හැරුණු කල වෙනත් අන් කිසිවක් වෙත තදින් අවධානය යොමු කළේ වී නම් ඒ සතුන් කෙරෙහි. එසේ සතුන් දැකීමෙන් හා හැසිරීම නිරීක්ෂණය කිරීමෙන් ලබාගත් දැනුම හා අත්දැකීම් යොදා ගනිමින් මිනිසා විසින් සපයන ආහාර හා පාරිසරික වටාපිටාවකට හුරු කරමින් සතුන් ගෘහාශ්‍රිතකරණය කරන ලදි. වසර 6000කට පමණ පෙර සිදු වූ එම ක්‍රියාවලිය අතීත මිනිසාගේ ආහාර සුරක්ෂිතතාව යම්තාක් දුරකට ස්ථාවර කරන ලදි.

1991 දී සිගිරියට නුදුරේ වූ පොතාන නම් ස්ථානයේ ගල් ගුහාවක් මීටරයක් යටට කැණීමෙන් මානව හා සත්ත්ව අස්ථි, ගල් ආයුධ, උද්භිද අවශේෂ, වළං කටු යනාදි පුරාකෘති රැසක් අතින් වෙන් කර ගැනීම, තෙත්ව සහ වියළිව පෙනේරවලින් හැලීමෙන් *(wet and dry sieving)* සොයා ගන්නා ලදී. කාබන් කාලනිර්ණයට අනුව ක්‍රි.පූ. 3913 - 3727 සහ ක්‍රි.පූ. 3916 - 3709 අතර කාලයකට පෙර එහි විසූ ශ්‍රී ලංකාවේ මෙසොලිතික යුගයට අයත් ප්‍රාග් මිනිසුන්ගේ ජීවන වෘත්තිය අනුමාන වශයෙන් හඳුනා ගැනිම කෙරෙහි මෙහිදී අවධානය යොමු කෙරේ. මෙම සත්ත්ව අස්ථි එකතුවේ අස්ථි කොටස් 2606ක් සංසන්දනාත්මක අධ්‍යයන *(comparative study)* මඟින් සත්ත්ව විශේෂ 34ක් දක්වා හඳුනා ගැනීමට හැකි විය. එය ස්කන්ධයක් වශයෙන් කිලෝග්‍රෑම් 28.400ක ප්‍රමාණයකි. විශාල සහ කුඩා ක්ෂීරපායින් සහ උෟරගයින් කුරුල්ලන් සහ මොලොස්කාවන්ට අයත් අස්ථි සහ කවචවලින් එය සමන්විත විය. එම එකතුව පුරාසත්ත්ව විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණ කරමින් පොතාන ගුහා නිවැසියන්ගේ මස් පරිභෝජනය, මස් සකස් කර ගැනීමේ තාක්‍ෂණය ඒ සඳහා භාවිතා කරන ලද ගල් ආයුධවල ස්වභාවය සහ අතීත පාරිසරික වටපිටාව යන ප්‍රධාන කරුණු මෙම පත්‍රිකාවෙන් සාකච්ඡාවට ගැනිමට නියමිතය.

ප්‍රමුඛ පද: *පුරාසත්ත්ව විද්‍යාව, පුරා කෘති, ගෘහාශ්‍රිතකරණය, මෙසොලිතික යුගය*